# බේරුවල නගර සභාව

# කළුතර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 16 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.1,706,135 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.838,308 ක් වශයෙන් දැක්වීම හේතුවෙන් ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.867,827 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මහජන බැංකුවේ ජංගම ගිණුමේ රු.232,055 ක් වූ ශේෂය ස්ථාවර තැන්පත් ශේෂයෙහි මෙන්ම මුදල් ශේෂයෙහිද දක්වා තිබීම හේතුවෙන් ජංගම වත්කම් රු.232,055 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) පුස්තකාල පොත් නැතිවීම සම්බන්ධයෙන් සේවක වැටුපෙන් අයකර තිබුණු රු.27,683 ක් පුස්තකාල පොත් ගිණුම බැර කළ යුතු වුවත්, නිවාඩු දින වැටුප් ගිණුමට බැර කර තිබුණි.

(ඇ) ලී බඩු හා සවිකිරීම් උපලේඛනයේ ඇති රු.155,710 ක ක්‍රීඩා උපකරණ භෞතිකව සභාවේ නොතිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.6,490,999 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.42,076,220 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු. 28,402,723 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.13,673,497 ක වර්ධනයක් දක්නට ලැබුණි.

මූල්‍ය ප්‍රතිඵලයේ රු. 13,673,497 ක වර්ධනය කෙරෙහි ආදායම් රු.19,276,427 කින් වැඩිවීම හා වියදම් රු.5,602,930 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 16,692 | 10,383 | 17,960 |
| (ii) බදු කුලී | 23,333 | 22,438 | 895 |
| (iii) බලපත්‍ර ගාස්තු | 130 | 122 | 08 |
| (v) වෙනත් ආදායම් | 127 | 125 | 02 |

2.2.2 **වරිපනම් බදු**

(අ) 2016 ජනවාරි 01 දිනට රු.23,673,517 ක් වූ හිඟ හිටි වරිපනම් බදු ශේෂයෙන් 2016 දෙසැම්බර් 31 වන විට රු.12,022,611 ක් හෙවත් සියයට 51 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) 2016 වර්ෂය සඳහා බිල් කිරීම රු.15,267,162 ක් වූ අතර ඉන් අයකරගෙන තිබුණේ රු.9,013,326 ක් හෙවත් සියයට 59 ක් පමණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි රු.18,643,991 ක් වූ ශේෂය තුළ අවුරුදු 3 සිට 5 අතර වරිපනම් ඒකක 2065 කින් රු.7,237,365 ක්, අවුරුදු 5 සිට 10 අතර වරිපනම් ඒකක 1083 කින් රු.3,129,374 ක් හා අවුරුදු 10 ට වැඩි වරිපනම් ඒකක 395 කින් රු.1,384,022 ක් විය. තවද, රු.50,000 ට වැඩි වරිපනම් ඒකක 06 කින් රු.448,551 ක් හා රු.30,000 සිට රු.50,000 දක්වා වරිපනම් ඒකක 11 කින් රු.503,044 ක් ඉහත හිඟ ශේෂය තුළ ඇතුළත්ව තිබුණි.

(ඇ) 2014 සිට 2016 ඔක්තෝබර් 31 දක්වා ලැබී තිබූ ගොඩනැගිලි අයදුම්පත් 163 ක් අනුමත කර තිබූ අතර එම අනුමත කළ සැලසුම්වලින් 08 ක් සඳහා අනුකූලතා සහතික ලබා දී තිබුණි. අනුකූලතා සහතික ලබා නොගත් ගොඩනැගිලි 155 ක් සඳහා පරීක්ෂා කර බලා අනුකූලතා සහතික ලබාදී නව තක්සේරුවක් සිදු කර වරිපනම් ආදායම ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 **දැන්වීම් පුවරු ආදායම**

2016 නොවැම්බර් 02 දින සිදු කළ භෞතික පරීක්ෂාව අනුව දැන්වීම් පුවරු 12 කින් අය විය යුතු රු.79,012 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 63,720 |
| (ii) | මුද්දර ගාස්තු | 10,000,000 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනයෙන් පවරාදුන් බලතල අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දිය යුතු ආයතන 11 ක් සම්බන්ධයෙන් පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයට අයත් මාර්ග විවිධ කාර්යයන් සඳහා පළුදු කිරීමේදී අදාල පාරිභෝගිකයින්ගෙන් තැන්පත් මුදලක් අයකර තිබූ නමුත් එසේ අය කරන තැන්පත් මුදලින් පළුදු කරනු ලැබූ මාර්ග නැවත යථා තත්ත්වයට පත් කර නොතිබුණි.

තවද, සභාව විසින් 2016 සැප්තැම්බර් මාසය දක්වා පමණක් මාර්ග පළුදු කිරිම වෙනුවෙන් රු.516,771 ක් ලබාගෙන තිබුනු අතර එම මුදල් පොදු තැන්පත් ගිණුමෙහි තැන්පත් නොකර සභා ආදායමට ගෙන තිබුණි.

(ඇ) **සභාව සතු ඉඩම් පිළිබඳ පාලනය**

(i) නගර සභා ලේඛනවල ඇතුළත් අයිතිය තහවුරු කිරීමට හිමිකම් ඔප්පු නොමැති ඉඩම් 17 ක් තිබුණි.

(ii) කර්මාන්ත අංශයෙන් නඩත්තු කරන ඉඩම් පිළිබඳ ලේඛනයට ඇතුළත් නොවූ ගිණුම් අංශයේ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් ඉඩම් 4 ක් තිබුණි.

(iii) ගිණුම් අංශයේ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් නොවූ කර්මාන්ත අංශයේ ඉඩම් ලේඛනයේ ඇතුළත් ඉඩම් 4 ක් තිබුණි.

(iv) ගාළුපාර ශ්‍රී විජය ආපන ශාලාව පිටුපස පැරණි බාල්දි වැසිකිලිය පිහිටි ඉඩම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් පිරිසක් නඩු දමා තිබූ අතර මෙම ඉඩම සතුව හිමිකම් ඔප්පුවක් නගර සභාව සතු නොවීය. ඒ අනුව මෙම නඩුවේ තීරණය නගර සභාවට අවාසිදායක විය හැකි බව නිරීක්ෂණය විය.

(v) පැරණි ගව ඝාතකාගාරය පිහිටි ඉඩම ප්‍රදේශවාසීන් විසින් අත්පත් කරගෙන තිබූ අතර හිමිකම් ඔප්පු නොමැති වීමෙන් නීතිමය කටයුතු කිරීමට නොහැකි වී තිබුණි.

(vi) කොච්චිමලේ පල්ලිය අසල ඉඩම් කොටස් ප්‍රදේශවාසීන් විසින් අත්පත් කරගෙන තිබූ අතර එම ඉඩම සම්බන්ධයෙන් නගර සභාව සතුව පිඹුරුපත් තිබුණද හිමිකම් ඔප්පු නොතිබුණි.

3.2 **<u>නිශ්ක්‍රීය වත්කම්</u>**

මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාව අනුව වසර 5 කට අධික කාලයක සිට නිශ්ක්‍රියව පවතින රු.3,447,500 ක් වටිනා වාහන 6 ක් සහ වටිනාකම සඳහන් කර නොමැති වාහන 03 ක් තිබූ අතර මෙම වාහන අළුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට 2017 ජූනි 22 වන විටත් කටයුතු කර නොතිබුණි.

3.3 **<u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

(අ) සභා බල ප්‍රදේශයෙන් එකතු කරන කසළ බැහැර කිරීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් සභාව විසින් අනුගමනය කර නොතිබුණි.

(ආ) සභාව විසින් එකතු කරනු ලබන කසළ බැහැර කිරීම සඳහා 2013 සැප්තැම්බර් මාසයේදී රු.2,500,000 කට ඉඩමක් මිලදී ගෙන තිබුණු අතර එම ඉඩමට මාර්ග පහසුකම් නොමැති වීම හේතුවෙන් එකතු කරනු ලබන කසළ සහා ඉඩමට ආසන්නව පවතින පෞද්ගලික ඉඩමකට දමා තුනී කිරීම සිදු කර තිබුණි.

(ඇ) දැනට කසළ දමන ඉඩමට ආසන්නයේම අනවසරයෙන් තැනූ නිවාස විශාල ප්‍රමාණයක් පැවති අතර මෙම අනවසර ඉදිකිරීම් සම්බන්ධව සභාව විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4 **<u>කාර්යසාධනය</u>**

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ ස්ථිර තැන්පත්වල ආයෝජනය කර ඇති මුදල රු.44,284,818 ක් හා ජංගම ගිණුමේ ශේෂය රු.31,330,356 ක් වුවත්, සමාලෝචිත වර්ෂය තුළ කර්මාන්ත සඳහා වැය කළ මුදල රු.16,342,278 ක් පමණක් විය. ඒ අනුව සංවර්ධන කටයුතු සඳහා වැය කළ මුදල ආයෝජන වටිනාකමෙන් සියයට 22 ක් පමණි.

4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පාලනය

(ඇ) අයවැයකරණය

(ඈ) වත්කම් පාලනය